- ප්‍රාචීන භාෂෝපකාර සමිතිය මඟින් පවත්වනු ලබන අවසාන විභාගය;
- එක් වතාවකදී තුනකට නොඅඩු විෂයයන් ගණනකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් පමත්වීම;
- විද්‍යෝදය පිරිවෙනේ අවසාන විභාගය;
- විද්‍යාලංකාර පිරිවෙනේ අවසාන විභාගය;
- බෞද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ ත්‍රිපිටකවේදී අවසාන විභාගය;
- පිළිගත් විශ්වවිද්‍යාලයක අවසාන විභාගය;
- භික්ෂු අභ්‍යාස ආයතනයක පුහුණු ගුරු සහතිකය;
- රජයේ ගුරු අභ්‍යාස විද්‍යාලයක පුහුණු ගුරු සහතිකය;
- අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගුරු සහතිකය ; හෝ
- පිළිගත් විශ්වවිද්‍යාලයක අන්තර් - මධ්‍ය පරීක්ෂණය හෝ මණ්ඩලය විසින් පිළිගන්නා ලද වෙනත් යම් විභාගයක්.

(iv) ඔව්.

(v) එම පුරප්පාඩු සංඛ්‍යාව 563කි.

(vi)

- පරිවේණාචාර්ය සේවය සහ පිරිවෙන් අධ්‍යාපන අංශය සඳහා විධායක සේවා ගණයේ තනතුරු අනුමත කර ගැනීම සහ ඊට අදාළ විධිමත් බඳවා ගැනීමේ පරිපාටි කෙටුම්පත් කර උක්ත සේවාවල බඳවා ගැනීම් හා උසස් කිරීමේ ක්‍රමවේද විධිමත් කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කර ඇති ආයතනික හා පරිපාලන ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- අධයාපන ප්‍රතිසංස්කරණ හා විෂයමාලා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විභාග ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා ප්‍රගති සමාලෝචන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භෞතිකව හා මාර්ගගතව දිවයිනේ සියලු පිරිවෙන් සතිපතා අධීක්ෂණය කිරීම.
- පිරිවෙන් ගුරුවරු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාවේ හා අදාළ ගුරු විද්‍යාලවල සහයෝගීතාවෙන් පිරිවෙන් නුපුහුණු ගුරුවරු පුහුණු කිරීමේ පාඨමාලා පැවැත්වීම.
- ඵලදායිතා ලේකම් කාර්යාලයේ සහයෝගීතාවෙන් පිරිවෙන් ඇගැයීමට ලක් කිරීම.
- පිරිවෙන් ගුරුවරු සඳහා සති භාවනා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා බාහිර සම්පත් දායකයින් මඟින් සුහුරු පන්ති කාමර ඉදි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- දුර්වල ශිෂ්‍ය සංඛ්‍යා සහිත පිරිවෙන් හඳුනාගෙන එම පිරිවෙන් වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් හා ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කර ගැනීම පිණිස "පිරිවෙන් පුනරුද" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
### தனி அறிவித்தல் மூல வினா
### QUESTION BY PRIVATE NOTICE

## IMF විස්තීර්ණ ණය පහසුකම යටතේ වන දෙවන වාරිකය
### IMFஇன் நீட்டிக்கப்பட்ட கடன் வசதியின் கீழான இரண்டாம் தவணை
### SECOND TRANCHE OF IMF EXTENDED FUND FACILITY

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති විස්තීර්ණ ණය පහසුකමට අදාළ EFF - Extended Fund Facility - ගිවිසුම අනුව ලබාදෙන දෙවන ණය වාරිකය වෙනුවෙන් පැවැති ප්‍රගති සමාලෝචන සාකච්ඡා පසුගිය සතියේ නිසි තීරණයකින් තොරව අවසන් වී ඇති බව වාර්තා වෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ වැඩ පිළිවෙළ නිසි කාර්යක්ෂමතාවකින් යුතුව සම්පූර්ණ කිරීමට රජය අපොහොසත් වී ඇති බව මෙයින් පෙනී යනවා. මේ නිසා එම ණය මුදලට අදාළ දෙවැනි වාරිකය අප වෙත ලබා දෙන දිනයක් හෝ නිශ්චිතව සඳහන් කළ නොහැකි වී තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා ශ්‍රී ලංකා රජය විසින් ආදායම් ඉලක්ක සපුරා ගැනීමත්, දූෂණ වංචා වැළැක්වීම ඇතුළු රාජ්‍ය පාලනයට සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීමත් සිදු කළ යුතුව ඇති බවට වාර්තා වෙනවා. එබැවින්, ඒවා ඉටුකර ගැනීම උදෙසා රජය අනුගමනය කරනු ලබන ඉදිරි වැඩ පිළිවෙළ කුමක්ද යන්න පිළිබඳව තොරතුරු දැන ගැනීම සමස්ත ජනතාවට වඩාත් වැදගත් වෙනවා.

එම නිසා ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් හැටියට එම ප්‍රශ්නය සහ අතුරු ප්‍රශ්න ගණනාවක් මම ඉදිරිපත් කරනවා.

01. IMF කාල රාමුවට අනුව කොපමණ කාර්යයන් ප්‍රමාණයක් මේ වන විට සම්පූර්ණ කිරීමට හැකි වී තිබේද? ඊට අනුකූලව තවත් කාර්යයන් ඉටු කිරීමට ඇත්ද? ඒ කොපමණ ප්‍රමාණයක්ද? ඒවා මොනවාද? එම ඉතිරිව ඇති කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි වූයේ මන්ද? IMF කොන්දේසි මොනවාද කියා දැනගන්න අපටත්, රටටත්, ජනතාවටත් අවශ්‍යයි. ඉටු කළ කොන්දේසි මොනවාද? ඉටු නොකර පැහැර හැරපු කොන්දේසි මොනවාද? එම කොන්දේසි මේ රජය IMF එකට පොරොන්දු වුණු කොන්දේසි. ඒවා රටට ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම කරනවා. IMF විසින් කළ යුතු බවට සඳහන් කෙරුණු කාර්යයන් අතුරින් රජය ක්‍රියාත්මක කිරීමට කැමැත්තක් නොදක්වන කරුණු තිබේද? එදා එකඟ වෙලා, දැන් එකඟ නොවන කරුණු තිබෙනවාද කියන එකයි මා අහන්නේ. එසේ නම් ඒ මොනවාද? එම කාර්යයන් ඉටු කිරීමට මීට පෙර රජය එකඟ වූයේ නැද්ද? එකඟ වූයේ නම්, දැන් ඒවා ක්‍රියාත්මක නොකරන්නේ මන්ද? කාල රාමුවට අනුව ඉටු කළ නොහැකි වූ නමුත්, එම කාර්යය ඉටු කිරීම සඳහා තවදුරටත් කාලය අවශ්‍ය බවට රජය ඉල්ලීම් කර තිබේද? ඒ මන්ද? එසේ තවදුරටත් කාලය අවශ්‍ය බව සඳහන් කරන ලද්දේ කුමන කර්තව්‍යයන් උදෙසාද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නවලට බොහොම පැහැදිලි පිළිතුරු අපි බලාපොරොත්තු වෙනවා.

IMF එකට ලබා දුන් පොරොන්දු මොනවාද? ඒවා එකින් එකට රටට හෙළිදරව් කරන්නේද? ඒ පොරොන්දු ක්‍රියාත්මක කරන්නට කටයුතු කළාද? ඒ කොපමණ ප්‍රමාණයක්ද? එදා පොරොන්දු වුණු ඒවා අද ක්‍රියාත්මක කරන්න බැරිද? මේ කරුණු සියල්ලටම පැහැදිලි උත්තර අපට රජයෙන් අවශ්‍යයි.

02. IMF සමඟ පැවති පළමු ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ගනු ලැබූ තීරණ මොනවාද? ඒ සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකි වන්නේද? නොඑසේ නම්, ඒ මන්ද? IMF විස්තීර්ණ ණය පහසුකමට අදාළ දෙවන වාරිකය ලබා ගැනීමට හැකි වන්නේ කවදා වන විටද? Extended Fund Facility එකේ second tranche එක ලැබෙන්නේ කවදා වන විටද?

03. රජය මේ වන විටත් වෘත්තිකයන්ගෙන් ඉතා ඉහළ බදු ප්‍රමාණයක් අය කරමින් සිටිනවා. එකතු කළ අගය මත පැනවූ බදු සහ වෙනත් බදු රැසක් ඉහළ නංවා තිබෙනවා. එමෙන්ම ඉන්ධන මිල, නළ ජලය සහ විදුලිය බිල් කිහිප වරක් ඉහළ නංවා ඇති අතර ඒවා නැවත වරක් ඉහළ නැංවීමට කටයුතු කරන බව වාර්තා වෙනවා. රජය තවදුරටත් රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කරන්නේද? ඒ කෙසේද? ඒ සඳහා තවදුරටත් සාමාන්‍ය ජනතාව හා වැඩ කරන ජනතාව මත බදු පැටවීමට රජය කටයුතු කරන්නේද? ඒ සඳහා නැවතත් විදුලි බිල්පත් ගාස්තු, ජල බිල්පත් ගාස්තු, ඉන්ධන මිල, ගෑස් මිල ඉහළ නැංවීමට රජය කටයුතු කරන්නේද? නැතහොත් රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට රජය අපේක්ෂා කරන්නේ කුමන මාර්ග ඔස්සේද? රජය තවත් කොපමණ ප්‍රමාණයකින් රාජ්‍ය ආදායම වැඩි කර ගත යුතු වන්නේද?

04. රාජ්‍ය ආදායම වැඩි කර ගත යුතුව තිබියදී රජය තෝරාගත් ව්‍යාපාරවලට පමණක් බදු සහන, බදු විරාම සහ බදු කපා හැරීම් ලබාදීම සඳහා කටයුතු කරනු ලබන්නේ ඇයි? දැනට රජය බදු සහන, බදු විරාම හා බදු කපා හැරීම් ලබා දී ඇත්තේ කවර ආයතන හෝ පාර්ශ්ව වෙතද? එලෙස එම පාර්ශ්වවලට බදු සහන ලබා දීම තුළින් රජයට අත් වී ඇති වාසි කවරේද? අද වන විට මෙරට ප්‍රමුඛ පෙළේ සමාගම් කිහිපයක් බදු ගෙවීම පැහැර හරිමින් සිටින බව රජය පිළිගන්නේද?

ඔබතුමන්ලා දැනගන්නට ඕනෑ, මත්පැන් නිෂ්පාදන ආයතන දෙකක් රුපියල් බිලියන 1.7ක් - මිලියන 1,700ක්; ලක්ෂ 17,000ක්- බදු ගෙවීම පැහැර හැර තිබෙන බව. පාර්ලිමේන්තුවේ කමිටුවකට ආපු නිලධාරින්ගෙන් ඇහුවාම, අහවල් විදේශ ආයතනයට ලබා දුන් බදු සහනයෙන් රටට ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා, ඒ නිලධාරින් කියා තිබෙනවා, ආයෝජකයාගෙන් අහලා කියන්නම් කියලා. එහෙව් බදු පරිපාලනයක් අපේ රටේ තිබෙන්නේ.

එසේ නම්, බදු අය විය යුත්තන්ගෙන් නිසි පරිදි බදු එකතු කර ගැනීම උදෙසා රජය යම් නිශ්චිත වැඩ පිළිවෙළක් දියත් කර තිබේද? ඒ කුමක්ද?

05. IMF එක විසින් 2023 සැප්තැම්බර් මස නිකුත් කරන ලද "Sri Lanka: Technical Assistance Report-Governance Diagnostic Assessment" එක අනුව, පසුගිය කාල සීමාව තුළ අල්ලස් හා දූෂණය මැඩලීමටත්, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදු වන අක්‍රමිකතා දුරු කරලීමටත්, බදු ආදායම් නිසි ලෙස පරිපාලනය කිරීමටත් රජය දිගින් දිගටම අසමත් වී තිබෙනවා. මෙම අර්බුද අවස්ථාවේ පවා මෙම තත්ත්වය පාලනය කරන්නට රජය අසමත් වූයේ මන්ද? මෙය යළි යථා තත්ත්වයට පත් කිරීමට රජය සතුව නිසි වැඩ පිළිවෙළක් තිබේද? එසේ නම්, ඒ කුමක්ද?

අපේ ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු සභානායකතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. IMF එකේ "Sri Lanka: Technical Assistance Report-Governance Diagnostic Assessment" එක සභාගත කරන්න මම කැමතියි. මේකේ සාරාංශය ගෙන බැලුවොත්, මෙහි තේරුම මොකක්ද? පරිපාලන දෝෂ විනිශ්චය වාර්තාවෙන් මොකක්ද IMF එක කියන්නේ? මේ රටේ දූෂණය ඉහ වහා ගිහිල්ලා ලු. සුළු කොටසක් අතර -සුළු ප්‍රභූ පවුල් ප්‍රමාණයක් අතර- බලය කේන්ද්‍රගත වීම තුළ, මහජන දේපළ අවභාවිත වීම තුළ, මේ දූෂිත ක්‍රමය තුළ, දූෂිත පවුල් පාලනය තුළ මේ රට බංකොලොත් වුණා කියලා අපි නොවෙයි කියන්නේ; IMF එකයි ඒක කියන්නේ. ඔබතුමන්ලා ගිවිසුම් ගහගත්තු IMF එකයි එහෙම කියන්නේ. එහෙම නම්, රටටම මේ කාරණය තේරෙන්නට ඕනෑ. මේ රටේ පාලනය තවදුරටත් ක්‍රියාත්මක වෙන්නේ මේ දූෂිත පවුල් පාලනයේ තවත් දිගුවක් හැටියටයි කියන එක මේ අවස්ථාවේ කියන්න කැමතියි. අද සුබසාධනය වැටිලා. දූෂණ විරෝධී ජාතික සැලැස්මක් නැහැ. නීතියේ ආධිපත්‍යය කඩා වැටිලා. ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වෙලා. මම නොවෙයි, IMF එකයි මේවා කියන්නේ. ඒ නිසා මේ IMF වාර්තාව ගරු අගමැතිතුමාත්, ගරු සභානායකතුමාත් හොඳින් කියවන්න. මම මේ වාර්තාව **සභාගත*** කරනවා.

මේක රජය පිළිගන්නවාද? මේක හරිද? මේ වාර්තාවේ අඩංගු දුර්වලතා නිසා නොවෙයිද second tranche එක අපේ රටට නොලැබුණේ? ගිවිසුම් ගැහුවා නම්, ගිවිසුම්වල එකඟතා ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලා කටයුතු කර නැත්තේ ඇයි?

06. රජයේ ඉහළ තනතුරු දරන පුද්ගලයන්ගේ විදෙස් සංචාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය නොවන වියදම් නැවතත් ඉහළ ගොස් ඇති තත්ත්වයක් තුළ රටේ වියදම් ඉලක්ක සාක්ෂාත් කරගත හැකිවේ ද? එළඹෙන 2024 වසරේ දී තවදුරටත් රාජ්‍ය වියදම අඩු කර ගැනීම කෙරෙහි රජයේ අවධානය යොමු වී තිබේ ද? එසේ නම් ඒ කෙසේ ද?

ගරු අගමැතිතුමනි, විශේෂඥ දැනුම තිබෙන, උගත්, බුද්ධිමත් නිලධාරින් ඇතුළු කණ්ඩායම් ජනාධිපතිතුමාත් එක්ක විදේශ සංචාරවලට ගියාට කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, අර උගතුන් පිරිසක් ද UN එකට අරගෙන ගියේ? රට විනාශ කරපු, පොහොර ටික නැති කරපු, ඇමති පොරොන්දු ඉෂ්ට නොකළ පිරිසක් තමයි UN එකට අරගෙන ගියේ. ඒ, විනිසුරුවරුන්ට, මැතිවරණ කොමිසමට විරුද්ධව Privilege Motions ගෙනාපු අයට ලබා දුන් සන්තෝසම්. අද වතුකරයේ මිනිස්සුන්ට කෑම නැහැ. වතුකරය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. දේශපාලන අල්ලසක් හැටියට විපක්ෂයේ මිනිහෙකුත් UN එකට අරගෙන යනවා. මොකක්ද මේ විහිළුව? ඔබතුමා දන්නවාද Business Class ticket එකක ගණන? මේ හැමෝටම *per diem* දුන්නා; හැමෝටම මහා වියදමක් දැරුවා. බංකොලොත් රටක මෙහෙම කටයුතු කරන එක හරිද කියලා මම අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාත් සභාවේ ඉන්න නිසා මම බරපතළ ප්‍රශ්නයක් මතු කරනවා. ගරු අගමැතිතුමනි, ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්. මමත් ඒකේ සාමාජිකයෙක්. අපි දූෂණ විරෝධී පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා. මේ දූෂණ විරෝධී පනත, තිබුණාටත් වැඩියෙන් දූෂණ විරෝධී ක්‍රමය ශක්තිමත්

---

** පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

කරන වැඩ පිළිවෙළක්. අපි හැමෝම ඒක පිළිගන්නවා. දූෂණ විරෝධී පනතේ 3 (1) උපවගන්තියේ තිබෙනවා, "the Commission to Investigate Allegations of Bribery or Corruption" කියලා. ඒ කොමිසම ඉතා වැදගත් වෙනවා. ඇත්ත වශයෙන්ම ඒකේ සංයුතියක් තිබෙනවා. ඒක පනතේ 4 (1) උපවගන්තියේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා. එම කොමිසමට සාමාජිකයන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත. හැබැයි දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේකේ නම සඳහන් වෙලා තිබෙන්නේ, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" කියලා. හැබැයි මේ පනතේ ස්ථාන 11ක එහි නම සඳහන්ව තිබෙන්නේ, "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියලා. මේ පනතේ ඉංග්‍රීසි පිටපතයි, සිංහල පිටපතයි අතර පරස්පරතාවක් තිබෙනකොට ඔබතුමන්ලාම දන්නවා, සිංහල පිටපත තමයි ප්‍රමුඛස්ථානය ගන්නේ කියන එක.

එතකොට නිවැරදිව, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යන්න මේ පනතේ සඳහන් නොවීම තුළ Commission එකේ සාමාජිකයන් පත් කරන්නට Constitutional Council එකට බැරි වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමා ඒක දන්නවා. අපි සාමාන්‍යයෙන් Constitutional Council එකේ දේවල් එළියේ කථා කරන්නේ නැහැ. නමුත් මේක බරපතළ ප්‍රශ්නයක්. IMF එක කියනවා, දූෂණය ඉහ වහා ගිහිල්ලා කියලා. ඒ නිකම් දූෂණ නොවෙයි, කුඩා පරිමාණයේ දූෂණ නොවෙයි, මහ පරිමාණයේ දූෂණ. ගරු අගමැතිතුමනි, එහෙම නම් අපි මේ පාර්ලිමේන්තුවේ කාලය උපයෝගී කරගෙන ඇත්තටම කරන්නට ඕනෑ, ඒ වරද නිවැරදි කිරීමයි. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" කියන වචනය, ඒ නිවැරදි වචනය පනතට ඇතුළත් කරන්නට ඕනෑ. එතැන ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ගැන කථා කරන්නේ කවුද? ඒක තිබෙනවා, මේ පනතේ. ඒ නිසාම Constitutional Council එකට මේ පත් කිරීම් ටික කරන්නට බැරි වෙලා තිබෙනවා. මම හිතන්නේ නැහැ, benevolent jurisdiction ක්‍රමය හරහා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා. මොකද, මේක fundamental flaw එකක්; මූලික අඩුපාඩුවක්. අපි ඒ අඩුපාඩුව අනිවාර්යයෙන්ම හදන්නට ඕනෑ.

අවසාන වශයෙන් මම තව කරුණු කිහිපයක් මතු කරන්නට ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමනි, දැන් බරපතළ කඩා වැටීමක් තිබෙනවා. දැන් මහ ලොකුවට සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්නට හදනවා. SriLankan Airlines එකේ ඒ වුණු සිදුවීම් එක්ක සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්නේ කොහොමද? ඒ සිදුවීම් නිසා රටට වූ අලාභය ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක්; රුපියල් බිලියන 1.9ක්. මෙහෙම වෙන්නේ කොහොමද ? මේවා හරිද? මේ තත්ත්වයට රජය ගන්නා පියවර මොකක්ද?

රජය අද කථා කිරීමේ නිදහස හැම අතකින්ම නතර කරන්නට යනවා; ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්නට යනවා. මේ ගෙනෙන්නට යන Anti-Terrorism Bill එක අනුව, යමක් කථා කළොත් හිරේ. රටේ අඩුපාඩු ගැන කථා කළොත්, ඒ ගොල්ලන් ත්‍රස්තවාදීන්. ඒවා හරිද? Online Safety Bill කියලා එකක් ගෙනැල්ලා, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? Apple, Amazon, Google, Meta, X, LinkedIn, Pinterest, Booking.com, Expedia, Rakuten, Shopify, Snap, Spotify, Grab, GoTo and LINE මේවා අඩංගු Asia Internet Coalition එක මේකට බරපතළ විරෝධය පළ කරලා තිබෙනවා. දැන් ඒ අයත් එළවා ගන්නද හදන්නේ? එහෙම එළවා ගෙන, රටක විදේශ ආයෝජන ප්‍රවර්ධනය කරන්න පුළුවන්ද? මොනවාද, මේ කරන බහුබූත ක්‍රියා? මම කාරුණික ඉල්ලීමක් කරනවා. මේ Anti-Terrorism Bill එකයි, Online Safety Bill එකයි ගෙනැල්ලා මොකක්ද කරන්න හදන්නේ? Online එකේ කිසිම safety එකක් නැහැ.

මේකෙන් රජයේ ආරක්ෂාවයි තහවුරු කරන්නේ; ජනාධිපතිගේ ආරක්ෂාවයි තහවුරු කරන්නේ; ආණ්ඩුවේ ආරක්ෂාවයි තහවුරු කරන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත වහාම ඉල්ලා අස් කර ගන්න. මේක ආඥාදායක, ඒකාධිපති, ඉතා දරුණු වැඩ පිළිවෙළක්. ඒ නිසා මේ පනත් කෙටුම්පත වහාම ඉල්ලා අස් කර ගන්න කියා ඉල්ලීමක් කරමින්, මම ස්ථාවර නියෝග 27(2) යටතේ අසා තිබෙන ප්‍රශ්නවලට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. කරුණාකරලා එම ප්‍රශ්නවලට පිළිතුර ලබා දෙන්නට කටයුතු කරන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කරන ලද Anti-Corruption Act එකේ වචන පරිවර්තනයේ තිබූ දෝෂය නිවැරදි කිරීමට මේ වනවිට පියවර ගනිමින් සිටිනවා, ඒ නිසි ක්‍රියාදාමය අනුගමනය කරමින්.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ පළමුවන ප්‍රශ්නය යොමු වුණේ විශේෂයෙන්ම IMF එක හා සම්බන්ධ වූ කරුණු රාශියක් සම්බන්ධයෙන්. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා හෙට දිනයේ ඒ සඳහා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීමට බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල තරුණ නියෝජනය වැඩි කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත්

## சிறப்புரிமை: பாராளுமன்ற, மாகாண சபை மற்றும் உள்ளூர் அதிகாரசபை மட்டங்களில் இளைஞர் பிரதிநிதித்துவத்தை அதிகரித்தல் தொடர்பில் சமர்ப்பிக்கப்பட்ட தனியார் உறுப்பினர் சட்டமூலங்கள்

## PRIVILEGE: PRIVATE MEMBERS' BILLS SEEKING TO INCREASE YOUTH REPRESENTATION AT PARLIAMENTARY, PROVINCIAL AND LOCAL GOVERNMENT LEVELS

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද කඩවීම පිළිබඳව වූ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සඳහා මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

මන්ත්‍රීවරයකු ලෙස මගේ කාර්යභාරය ඉටු කිරීමේ දී සිදුවෙලා තිබෙන වෙනස්කම්, බාධා කිරීම්, විරුද්ධකම් මෙන්ම, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සභාවේ නියෝග පැහැර හැරීම